**ශීර්ෂය 110 - අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2017 වර්ෂය**

---

2017 අංක 32 දරන විසර්ජන (සංශෝධන) පනතින් සංශෝධිත 2016 අංක 24 දරන විසර්ජන පනතේ පළමුවන උපලේඛනයේ හා තෙවන උපලේඛනයේ සඳහන් ශීර්ෂය හා විෂය අංකය යටතේ වන විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශය, අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය විසින් විගණනය වෙත ඉදිරිපත් කරන ලදී. එම ගිණුම්වලින් හා සැසඳුම් ප්‍රකාශනවලින් නිරූපනය වන මූල්‍ය හා භෞතික කාර්යසාධනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණනය කරන ලදී.

**1.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ, මූල්‍ය කළමනාකරණය හා ගිණුම් කටයුතුභාවය පිළිබඳ වගකීම**

---

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 124 ප්‍රකාරව රාජ්‍ය මුදල් ඉපැයීම සහ රජයට ලැබිය යුතු මුදල් එකතු කිරීම මෙන්ම රජයේ සියළුම මුදල් කටයුතු අධීක්ෂණය පිළිබඳ පොදු අවේක්ෂණයද මුදල් අමාත්‍යවරයා වෙත පැවරී ඇත. මුදල් අමාත්‍යවරයා විසින් එම වගකීම ඉටු කිරීම පිණිස මුදල් රෙගුලාසි 124(2) ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් පත් කර ඇත. මුදල් රෙගුලාසි 125(1)(අ) ප්‍රකාරව දෙපාර්තමේන්තු ප්‍රධානියා තම දෙපාර්තමේන්තුවේ සියළු මුදල් ගනුදෙනු පිළිබඳව ගණන්දීමේ නිලධාරියා වන අතර ආදායම් ගණන්දීමේ නිලධාරියා භාණ්ඩාගාරය විසින් පත්කර ඇත. පාර්ලිමේන්තුව විසින් පනවන ලද සීමාවන් ඇතුළත තම කාර්යභාරයන් ඉටු කර ඉදිරිපත් කරනු ලබන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රජයේ මුදල් රෙගුලාසි හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට ආදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**1.3 විගණන විෂය පථය**

---

ශීර්ෂය 110 - අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය හා භෞතික කාර්යසාධනය සම්බන්ධයෙන් සැලැසුම් කිරීම, රාජ්‍ය වියදම්, රාජ්‍ය ආදායම්, මානව හා භෞතික සම්පත් කළමනාකරණය, අභ්‍යන්තර පාලන විධිවිධාන යොදා ගැනීම, නීති, රීති හා රෙගුලාසිවලට අනුකූලවීම හා පොත්පත්, ලේඛන, වාර්තා හා සැසඳුම් ප්‍රකාශන යාවත්කාලීන කර පවත්වා ගැනීම, ගිණුම් පිළියෙල කර කාලීනව ඉදිරිපත් කිරීම, කාර්යසාධන දර්ශක පදනම් කරගෙන අදාළ පාර්ශවයන් වෙත කාර්යසාධන වාර්තා නිකුත් කිරීම පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2017 ඔක්තෝබර් 23 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද සැලැසුම්, ගිණුම්, සැසඳුම් ප්‍රකාශන හා කාර්යසාධන වාර්තා පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.4 විගණන නිරීක්ෂණය

------------------------

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ සිදු කරන ලද විගණනයේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ ඉහත 1.3 ඡේදයේ සඳහන් කර ඇති කළමනාකරණ විගණන වාර්තාවේ විස්තරාත්මකව දක්වා ඇත. එම නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ මෙම වාර්තාවේ 2.1 ඡේදයේ සිට 2.11 ඡේදය දක්වා ඡේදවල සඳහන් කර ඇත. මූල්‍ය පරිපාලනයේ ප්‍රමාණවත් බව තහවුරු වන පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 127 හි සඳහන් විධිවිධාන ඉටුකිරීමේදී අනාවරණය වූ පහත සඳහන් සටහනේ සාරාංශගත කර දක්වා ඇති විගණන නිරීක්ෂණවලට යටත්ව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී තම ගිණුම් කටයුතුභාවය සතුටුදායක ලෙස ඉටු තිබුණු බව නිරීක්ෂණය විය.

| **මුදල් රෙගුලාසි 127 ප්‍රකාර ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ ගිණුම් කටයුතුභාවය** | | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරී එම විධිවිධානයට අනුගත වී නොතිබීම** | **නිරීක්ෂණය ඇතුළත් වාර්තාවේ ඡේද යොමුව** |
|---|---|---|---|
| මුදල් රෙගුලාසිය | | | |
| 127(1)(අ) | නිවැරදිව සහ මූල්‍ය විධිමත් බවෙන් යුක්තව කටයුතු කරන බව තහවුරුවන පරිදි සියළු මූල්‍ය කාර්යයන් සැලැසුම් කළ යුතු බව. | 1. ක්‍රියාකාරී සැලැස්මේ අඩුපාඩු | 2.1.1 |
| | | 2. ලේඛන හා පොත්පත් පවත්වා ගැනීමේ අඩුපාඩු | 2.8 |
| | | 3. කාර්ය මණ්ඩලය පුහුණු කිරිමේ අඩුපාඩු | 2.11(ආ) |
| 127(1)(ආ) | වියදම් සහ රාජ්‍ය ආදායම් එකතු කිරීම පිළිබඳව ප්‍රමාණවත් තරම් පාලනයකට විධිවිධාන සැලැසෙන ක්‍රමයක් සම්පාදනය කළ යුතු බව. | බඳවා ගෙන තිබුණු අතිරික්ත කාරය මණ්ඩලය සඳහා අනුමැතිය ලබා නොගැනීම | 2.11(අ) |
| 127(2) | තමාගේ පාලනය යටතේ පවත්නා දෙපාර්තමේන්තුවල එවකට තිබෙන වැය විෂයයන් මෙන්ම අළුතින් හෝ වැඩියෙන් | 1. ව්‍යාපෘති ක්‍රියාත්මක නොකිරිම | 2.1.2 |
| | | 2. වැඩසටහන් අපේක්ෂිත පරිදි ඉටු නොකිරිම | 2.1.3 |

| | | | |
|---|---|---|---|
| | වියදම් කිරීම සඳහා වන යෝජනා සැකසුරුවම්කම හා කාර්යක්ෂමතාවය අතින් අමාත්‍යාංශයේදී තියුණු පරීක්ෂාවකට භාජනය කළ යුතු බව. | 3. ප්‍රසම්පාදන ක්‍රියාවලියේ අඩුපාඩු | 2.2 |
| 127(3) | ස්වකීය පරිපාලනාත්මක කෘතහස්තතාව හා විචාර බුද්ධිය මෙහෙයවා සුදුසු පරිදි ක්‍රියා කළ හැකි වන පිණිස සැකැයක් හෝ උද්ගත වී ඇති සියළු ප්‍රශ්න තමා වෙත ඉදිරිපත් වෙන ආකාරය සලසා තිබුණු බව. | නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම් | 2.3 |
| 127(5) | දෙපාර්තමේන්තුවේ ඇස්තමේන්තුවල ප්‍රතිපාදිත මුදල හා වියදම අතර ඇති සැලැකිය යුතු වෙනස්වීම් අමාත්‍යාංශයේ දැඩි ලෙස පරීක්ෂණයට භාජනය කෙරෙන බව. | 1. ප්‍රතිපාදන ඉක්මවා බැරකම්වලට එළඹීම.<br>2. සලසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය නොකිරිම<br>3. අධි ප්‍රතිපාදන සලසා ගැනීම | 2.4<br>2.6(අ)<br>2.6(ආ) |
| 127(6) | ගණන්දීමේ නිලධාරීන්ගේ වගකීම පිට පවත්නා වූ ආදායම් නොහොත් රජයට ලැබිය යුතු වෙනත් ගාස්තු එකතු කිරීමේ කාර්යය ගැන දැඩි සෙවිල්ලෙන් සිටිමින් එම කාර්යය අමාත්‍යාංශයේ පරීක්ෂණයකට භාජනය කරන බව. | රජයේ නිලධාරීන්ගේ හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමට අපොහොසත්වීම | 2.7(අ) |
| 127(7) | නිලධාරීන්ගේ/ සේවකයින්ගේ ප්‍රමාදය, නොසැලැකිල්ල, වරද හෝ වංචාව නිසා රජයට පාඩු සිදු වී ඇති අවස්ථාවලදී මුදල් රෙගුලාසි 103 සිට 108 දක්වා රෙගුලාසිවල නියම කර ඇති කාර්ය පරිපාටිය ගණන්දීමේ නිලධාරීන් විසින් අනුගමනය කරනු ලබන බවටද, මුදල් රෙගුලාසි 156(1) අනුව එම පාඩු සම්බන්ධයෙන් වගකිව යුතු | පාඩු හා හානිවීම් | 2.5 |

නිලධාරීන්/සේවකයන් මත අධිභාර පැනවීමද, වගබලා ගැනීම පිණිස විධිවිධාන යොදන ලද්දේනම් තමා වෙත පැවැරී ඇති වගකීම්වලින් ගණන්දීමේ නිලධාරියා නිදහස් වූවාක් ලෙස සලකනු ලැබේ. රාජ්‍ය ගිණුම් කාරක සභාව හමුවේ පෙනී සිට, තමා වගකීම් දරන දෙපාර්තමේන්තුවල ගිණුම් පැහැදිලි කිරීමෙන් හා සාධාරණීය කිරීමෙන් ගණන්දීමේ නිලධාරියා සමඟ සහාය වීමද ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ රාජකාරී භාරයක් බව,

## 2. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

-----------------------------------------------

### 2.1 කාර්යසාධනය

----------------

#### 2.1.1 සැලැසුම් කිරීම

----------------

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2017 වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලැස්ම අනුව සමාලෝචිත වර්ෂයේදී අමාත්‍යාංශය විසින් ඉටු කළ යුතු ප්‍රධාන කාර්යභාරයන් 17 ක් පැවැතුණි. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ප්‍රධාන කාර්යයන් ඉටු කෙරෙන ආකාරයට ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයට යාවත්කාලීන කළ ආයතනයේ සංවිධාන ව්‍යුහය, අනුමත කාර්ය මණ්ඩලය සහ දැනට සේවයේ යෙදී සිටින කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර ඉදිරිපත් කර නොතිබුණි.

#### 2.1.2 ව්‍යාපෘති ක්‍රියාත්මක නොකිරීම

-------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) යුක්තිය පසිඳලීම පිළිබඳ ක්‍රියාවලිය ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය සඳහා 2017 වර්ෂයේදී රු. මිලියන 15 ක ප්‍රතිපාදන සලසා තිබුණි. විදේශ ආධාර සපයන්නකු ඉදිරිපත් නොවීම හේතුවෙන් අදාළ ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ කර නොතිබුණි.

(ආ) රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා වැය විෂයයන් 02 ක් යටතේ එකතුව රු.600,000 ක ප්‍රතිපාදන සලසා තිබුණද, අදාළ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබුණි.

## 2.1.3 වැඩසටහන් අපේක්ෂිත පරිදි ක්‍රියාත්මක නොකිරීම

----------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අධිකරණ නොවන නිලධාරීන් පුහුණු කිරීමේ ආයතනය විසින් සමාලෝචිත වර්ෂයේදී පුහුණු වැඩසටහන් 60 ක් පැවැත්වීමට යෝජනා කර ඒ සඳහා රු.මිලියන 20 ක ඇස්තමේන්තුවක් පිළියෙල කර තිබුණි. නමුත් එම වැඩසටහන සඳහා රු. මිලියන 10 ක ප්‍රතිපාදන සලසා තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විට එම ප්‍රතිපාදනයෙන් රු.මිලියන 4.5 ක් වැය කර පුහුණු වැඩසටහන් 31 ක් පමණක් පවත්වා තිබුණි.

(ආ) දැනට පවත්නා නීති පද්ධති ප්‍රතිසංස්කරණයන් පිළිබඳ වැඩසටහන් යටතේ සමාලෝචිත වර්ෂයේදී නීති වාර්තා 50 ක් පරිවර්තනය කිරීමට සැලැසුම් කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විට නීති වාර්තා 34 ක් පමණක් පරිවර්තනය කර තිබුණි.

## 2.2 ප්‍රසම්පාදන ක්‍රියාවලිය

------------------------

සමාලෝචිත වර්ෂයේදී අමාත්‍යාංශය විසින් සැපයිම් හා සේවා ඉටු කර ගැනීම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කිරීමේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

(අ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 මාර්ගෝපදේශය ප්‍රකාරව වැඩ, භාණ්ඩ හා සේවා සඳහා විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

(ආ) අමාත්‍යාංශයට අවශ්‍ය ටයර් හා බැටරි මිල දී ගැනීම සඳහා රු.6,804,950 ක ප්‍රතිපාදන සලසා ගෙන තිබුණි. නමුත් සමාලෝචිත වර්ෂය අවසන් වන විට ඉන් රු.2,583,596 ක් පමණක් වියදම් කර තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය සඳහා ටයර් හා ටියුබ් මිලදී ගැනීම සඳහා අධි ඇස්තමේන්තු කිරිමක් සිදු කර තිබුණු බව අනාවරණය විය. එසේම එම වැය විෂය යටතේ ප්‍රතිපාදන ඉතිරිව තිබුණත්, සමාලෝචිත වර්ෂයේ ඔක්තෝබර් මාසයේ සිට දෙසැම්බර් මාසය දක්වා කාලය තුළ රු.1,130,136 ක් වටිනා ටයර් හා ටියුබ් මිලදී ගෙන තිබුණත්, එම වියදම මූලධන වැය විෂයයක් යටතේ ගිණුම්ගත කර තිබුණි.

(ඇ) අමාත්‍යාංශය විසින් සමාලෝචිත වර්ෂයේදී එකතුව රු.මිලියන 1.66 ක් වැය කර වායුසමීකරණ 10 ක් මිලදී ගෙන තිබුණි. මෙම ප්‍රසම්පාදනය රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධානවලට අනුකූලව සිදු කර නොතිබුණි. එමෙන්ම වායුසමීකරණ යන්ත්‍ර 04 ක් සඳහා ඉදිරිපත් කර තිබුණු අවම ලංසුව වෙනුවට ඉහළ ලංසුවක් පිලිගැනීම නිසා රු.106,232 ක මූල්‍යමය පාඩුවක් සිදු වී තිබුණි. රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.12.3 මාර්ගෝපදේශය ප්‍රකාරව යන්ත්‍ර භාරගත් නිලධාරියා විසින් එම යන්ත්‍ර නියමිත ප්‍රමිතිවලට අනුකූල බව සහතික කළ යුතු වුවත්, එසේ කර නොතිබුණි.

(ඈ) 2017 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්ම අනුව පුස්තකාල ආරක්ෂණ පද්ධතියක් මිල දී ගැනීම සඳහා රු.මිලියන 04 ක ප්‍රතිපාදන සලසා තිබුණි. ප්‍රසම්පාදන ක්‍රියාවලියේ සහ පිරිවිතර ලැයිස්තුවල තිබූ දෝෂ සහ අඩුපාඩු හේතුවෙන් ලැබී තිබූ ලංසු අගැයීමට ලක් කිරීමට නොහැකි වීම නිසා සමාලෝචිත වර්ෂයේදී එම ප්‍රසම්පාදනය කිරීමට නොහැකි වී තිබුණි.

**2.3 වත්කම් කළමනාකරණය**

**----------------------------**

**නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

**-----------------------------------------**

2017 දෙසැම්බර් 31 දිනට අධිකරණ අමාත්‍යාංශයේ වාහන සමීක්ෂණ වාර්තාවට අනුව වාහන 13 ක් නිෂ්ක්‍රීයව හෝ ඌන උපයෝජිතව තිබුණි.

**2.4 බැදීම් හා බැරකම්**

**--------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2017 අප්‍රේල් 27 දිනැති අංක 255/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍ර ලේඛයේ 02(අ) ඡේදයට අනුකූල නොවී වැය විෂයයන් 02 ක් සඳහා සලසා තිබුණු රු.මිලියන 9.52 ක ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු ඉතිරිය රු.357,103 කින් ඉක්මවා රු.358,112 ක බැරකම්වලට එළඹ තිබුණි.

(ආ) මුදල් රෙගුලාසි 94(2) හා (3) ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේදී එළඹ තිබුණු රු.222,187 ක බැදීම්, විසර්ජන ගිණුමේ බැරකම් ප්‍රකාශයේ දක්වා නොතිබුණි.

**2.5 පාඩු හා හානි**

**--------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී අමාත්‍යාංශය සතු වාහන 05 ක් අනතුරට පත්වී තිබුණත්, එම අනතුරුවලින් සිදු වී තිබුණු අලාභයන් තක්සේරු කර නොතිබුණි.

(ආ) 2016 මාර්තු 08 දින අමාත්‍යාංශයේ වාහනයකට සිදු වී තිබුණු අනතුරකින් රු.431,120 ක අලාභහානියක් සිදු වී තිබුණි. එම හානිය ප්‍රතිපූර්ණය කර ගැනීම සඳහා අදාළ රක්ෂණ ආයතනයෙන් ප්‍රමාද වී ඉල්ලුම් කිරිම නිසා එම වන්දිය ගෙවීම රක්ෂණ ආයතනය ප්‍රතික්ෂේප කර තිබුණි. මෙම අනතුර සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව කටයුතු කර අලාභයට වගකිව යුතු පාර්ශවයන්ගෙන් අලාභහානිය අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අමාත්‍යාංශය අපොහොසත් වී තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී අමාත්‍යාංශය සතු වාහනවලට අවස්ථා 16 කදී සිදු වී තිබුණු අනතුරු සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**2.6 කාර්යභාරයන් ඉටු කිරිම සඳහා පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදනය උපයෝජනය කිරිම**

**--------------------------------------------------------------------------------------------------------**

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය හා ඉකුත් වර්ෂය තුළ අමාත්‍යාංශයට සලසා තිබුණු ප්‍රතිපාදනය, උපයෝජනය හා ඉතිරිය පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| වර්ෂය | වියදම් වර්ගය | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| | | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | |
| 2016 | පුනරාවර්තන | 841.48 | 746.63 | 94.85 | 11.27 |
| | මූලධන | 505.49 | 320.25 | 185.24 | 36.65 |
| | **එකතුව** | **1,346.97** | **1,066.88** | **280.09** | **20.79** |
| 2017 | පුනරාවර්තන | 836.57 | 792.93 | 43.64 | 5.22 |
| | මූලධන | 242.95 | 178.75 | 64.20 | 26.42 |
| | **එකතුව** | **1,079.52** | **971.68** | **107.84** | 9.99 |

සමාලෝචිත වර්ෂය සඳහා සලසා තිබුණු ප්‍රතිපාදනය හා උපයෝජනය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) **සලසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය නොකිරීම**

පුනරාවර්තන වැය විෂයන් 04 ක් හා මූලධන වැය විෂයයන් 04 ක් සඳහා සලසා තිබුණු රු.මිලියන 14.9 ක් වූ මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් කිසිදු උපයෝජනයක් නොකර මුළුමනින්ම ඉතිරි කර තිබුණි.

(ආ) **අධි ප්‍රතිපාදන සලසා තිබීම**

පුනරාවර්තන වැය විෂයන් 15 ක් හා මූලධන වැය විෂයන් 11 ක් සඳහා එකතුව රු.මිලියන 68.5 ක අධි ප්‍රතිපාදන සලසා තිබීම නිසා සමාලෝචිත වර්ෂය අවසන් වන විට එම වැය විෂයයන්ට අදාළ උපයෝජනයන් කළ පසු ඉතිරිය සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 20 ක සිට සියයට 99 ක දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි.

## 2.7 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

අමාත්‍යාංශයට අදාල විෂය අංක 11001 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 26.00 | 25.21 | 9.00 | 12.34 | 100.00 | 56.61 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) හිඟ හිටි ණය ශේෂ අයකර නොගැනීම

විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව 2017 දෙසැම්බර් 31 දිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව ස්ථාන මාරුවී ගිය නිලධාරීන්ගේ ණය ශේෂ හැර රු.මිලියන 1.42 ක් වූ අතර, එම හිඟහිටි ණය ශේෂ වර්ෂ 01 ක සිට වර්ෂ 25 ක් දක්වා කාල පරාසයක සිට පැවැත එමින් තිබුණත්, එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අමාත්‍යාංශය අපොහොසත් වී තිබුණි.

(ආ) කේවල ණය ශේෂ ලේඛනයේ අඩුපාඩු

සමාලෝචිත වර්ෂය අවසන් වන විට රු.119,141 ක් වූ ගං වතුර ආපදා ණය කේවල ශේෂ ලැයිස්තුවේ දේපල ණය යටතේ පෙන්නුම් කර තිබුණි.

## 2.8 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර ඇතැම් ලේඛන විධිමත්ව යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාළ රෙගුලාසිය | නිරීක්ෂණ |
|---|---|---|---|
| (i) | ලංසු කැඳවීමේ ලේඛනය | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.2.1 මාර්ගෝපදේශය | පවත්වා නොතිබුණි. |
| (ii) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | යාවත්කාලීන කර නොතිබුණි. |
| (ii) | හානි පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 110 | යාවත්කාලීන කර නොතිබුණි. |

## 2.9 අභ්‍යන්තර විගණනය

මුදල් රෙගුලාසි 133 ප්‍රකාරව අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර තිබුණු අතර, සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු අභ්‍යන්තර විගණන වැඩසටහන මුදල් රෙගුලාසි 133 හි සඳහන් කාර්යභාරයන් ඇතුළත් කර නොතිබුණි.

## 2.10 විගණන හා කළමනාකරණ කමිටුව

2016 ජනවාරි 28 දිනැති අංක DMA/2009(1) (i) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයෙන් සංශෝධිත 2009 ජුනි 09 දිනැති අංක DMA/2009(1) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටුව අවම වශයෙන් කාර්තුවකට වරක් බැගින් වර්ෂයකදී කමිටුවේ රැස්වීම් වාර 04 ක් පැවැත්විය යුතුව තිබුණත්, සමාලෝචිත වර්ෂය වෙනුවෙන් රැස්වීම් වාර 02 ක් පමණක් පවත්වා තිබුණි.

## 2.11 මානව සම්පත් කළමනාකරණය

**අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගල පඩිනඩි සඳහා වියදම**

2017 දෙසැම්බර් 31 දිනට අනුමත, තථ්‍ය, පුරප්පාඩු හා අතිරික්ත කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 37 | 27 | 10 | - |
| (ii) | තෘතියික මට්ටම | 35 | 24 | 13 | 02 |
| (iii) | ද්විතියික මට්ටම | 157 | 134 | 27 | 04 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 113 | 109 | 04 | - |
| (v) | අනියම්/කොන්ත්‍රාත් | - | 04 | - | 04 |
| (vi) | අධිකරණ නොවන නිලධාරීන් පුහුණු කිරීමේ ආයතනය | 04 | 04 | - | - |
| | **එකතුව** | **346** | **302** | **54** | **10** |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අනුමත සීමාව ඉක්මවා 03 දෙනෙකුගෙන් යුත් කාර්ය මණ්ඩලයක් බඳවා ගෙන තිබුණත්, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත්, ඒ සඳහා විධිමත් අනුමැතියක් ලබා ගෙන නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී නිලධාරීන් 189 දෙනෙකුට අවම වශයෙන් පැය 08 කවත් පුහුණුවක් ලබා දී නොතිබුණි.